සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I	කාලය நேரம் Time	පැය 01යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 - 40 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුරු තෝරා දෙන ලද කොටු කොලයේ (×) ලකුණු යොදන්න.

01. වර්තමානයේ ලෝකයේ නිෂ්පාදනය කර ඇති පැන්සල් වර්ග 17 ක් අතරින් ජ්‍යාමිතික හැඩතල ඇඳීමේදී ආධාරක රේඛා සහ පිරිසැලසුම් චිත්‍ර ඇඳීමට භාවිතා කරන පැන්සල් වර්ගය වනුයේ,
1) HB පැන්සල 2) 2H පැන්සල 3) H පැන්සල 4) BB පැන්සල

02. ජ්‍යාමිතික හැඩතල ඇඳීම සඳහා භාවිතා කරන විහිත චතුරස්‍ර යුගලයේ කෝණයන් නිවැරදිව සටහන් වන පිළිතුර වන්නේ,
1) 30^0 , 60^0, 90^0 - 45^0, 45^0,90^0 2) 45^0,60^0,90^0 - 30^0 ,45^0,90^0
3) 60^0,45^0,30^0 - 30^0,45^0,45^0 4) 60^0,60^0,90^0 -45^0,30^0,90^0

03. බ්‍රිතාන්‍ය සම්මත ප්‍රමිතියට අනුව A3 කඩදාසි යනු,
1) අභ්‍යාස පොතක කඩදාසියයි. 2) යතුරු ලියන කඩදාසියයි.
3) ෆුල්ස් කැප් ප්‍රමාණයේ කඩදාසියයි. 4) සාමාන්‍ය ඇඳීමේ කඩදාසියයි.

04. A4 කඩදාසියේ සම්මත ප්‍රමාණය දැක්වෙන පිළිතුර වන්නේ,
1) 297 x 210 mm 2) 210 x 148 mm. 3) 420 x 297 mm 4) 594 x 420 mm

05. රූපයේ දැක්වෙන සම්මත රේඛාව භාවිතා කරන අවස්ථාවක් වන්නේ



1) සැඟි දාර දැක්වීම සඳහා 2) ඡේදනය කළ යුතු ස්ථාන දැක්වීම සඳහා
3) කඩ පෘෂ්ඨ දැක්වීම සඳහා 4) මධ්‍ය අක්ෂය හෝ සමමිතික බව දැක්වීම සඳහා

06. උදලු මිටක් සකස් කර ගැනීමේදී මිට රවුම් හැඩයට යතු ගා ගැනීමට වඩාත් සුදුසු යතු වර්ගය වනුයේ,
1) මට්ටම් යත්ත 2) තට්ටු යත්ත 3) පිහියා යත්ත 4) බොරදම් යත්ත

07. උපකරණ පමණක් සඳහන් පිළිතුර වන්නේ,
1) යතු තල, නියන්තල 2) අවගාරය බුරුමකටු
3) රැවටි බුරුමය, දුනු කියත 4) වැද්දුම් කරාමය, මුළු මට්ටම

Past Papers Wiki

08. ලී වල නෙත්ති, හරස් කැපුම් දාර, මුට්ටුවල හේත්තු ආදියේ කැපුම් රේඛා සලකුණු කර ගැනීමට වඩාත් සුදුසුම උපකරණය වන්නේ,

1) වරක්කලය 2) ලේසර් ලෙවලය 3) අදින පිහිය 4) පැන්සල

09. වර්තමානයේ හුණු මිශ්‍ර බදාම යොදගනු ලබන්නේ,

1) වහලේ කුමේර බැඳීමට 2) බිත්ති බැඳීමට
3) ගෙබීම බදාම කැපීමට 4) කොන්ක්‍රීට් ලින්ටල් දැමීමට

10. ජලය යට කරන වැඩ කටයුත්තක් සඳහා සකස් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍රණයකින් ලබාගත් නියැදියක් භාවිතා කර කරන ලද බැහුම් පරීක්ෂාවකදී එම කොන්ක්‍රීට් ව්‍යුහයේ බැස්මේ අගය විය හැක්කේ,

1) 10 - 25 mm 2) 50 - 75 mm 3) 100 - 175 mm 4) 75 – 100 mm

11. SLS ප්‍රමිතිය අනුව ඉංජිනේරු ගඩොලක දිග, පළල, උස පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

1) 220 x 102x 65 mm 2) 220 x 105 x 65 mm
3) 215 x 102.5 x 65 mm 4) 215 x 105 x 65 mm

12. මැටි ගඩොල් නිපද වීමට සුදුසු මැටිවල තිබිය යුතු වැලි සංයුතිය වන්නේ,

1) 12% - 15% 2) 30% -40% 3) 7% - 12% 4) 20% - 30%

13. කොපර් නැප්තනේට් භාවිතයට ගනු ලැබෙන්නේ,

1) දැව පදම් කිරීම සඳහා 2) දැව සංරක්ෂණය සඳහා
3) දැව නිමහම් කිරීම සඳහා 4) දැව ඇලවීම සඳහා

14. රාජ්‍ය දැව සංස්ථාවේ වර්ගීකරණයට අනුව සියලු දැව වර්ගීකරණය කර ඇති ශ්‍රේණි ගණන වන්නේ,

1) අටකි. 2) හයකි. 3) හතකි. 4) දහයකි.

15. පිලිස්සූ ඉංජිනේරු මැටි ගඩොලක ස්කන්ධය වන්නේ,

1) 2.9 Kg 2) 4.2Kg 3) 3.2 Kg 4) 2.4 Kg

16. වර්ථමානය වන විට ඉදිකිරීම් ක්ෂේත්‍රය විශාල පරිවර්ථනයක් ඇතිවීම කෙරෙහි විවිධ පුද්ගලයින්ගේ විද්‍යාත්මක සංකල්ප හේතු වී ඇත.

A. අත්හදා බැලීම් සිදුකිරීම.
B. අවශ්‍යතාවල සීමාවක් නොමැති වීම.
C. රැකියා අවස්ථා සුලභ වීම.
D. නව සොයා ගැනීම්.

ඉහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1) D 2) B 3) A 4) C

17. ලෝකයේ අද වන විට අපහසුතාවයකින් තොරව භාවිතයට ගත හැකි ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවීම නිසා ඊට විකල්පයක් ලෙස යොදා නොගැනෙන්නේ,

1) එකම නිවසේ පවුල් කිහිපයක් ජීවත් කරවීම. 2) පොළොව මට්ටමින් පහළ නිවෙස් ඉදිකිරීම.
3) මුහුදු යම් ප්‍රමාණයකට ගොඩ කර ඉදිකිරීම් සිදුකිරීම. 4) පොළොව මට්ටමින් ඉහළ නිවාස ඉදිකිරීම.

Past Papers Wiki

18. ඉදිකිරීම් කර්මාන්තයේදී ලඹය භාවිතයට ගනු ලබන්නේ,

1) සමාන්තර බව පරීක්ෂා කිරීම සඳහා.
2) සිරස් බව පරීක්ෂා කිරීම සඳහා.
3) තිරස් බව පරීක්ෂා කිරීම සඳහා
4) ආනත බව පරීක්ෂා කිරීම සඳහා.

19. යම්කිසි ද්‍රව්‍යයක් භාවිතා කර කිසියම් නිමවුමක් නිමකළ පසු එම නිමවුමේ වෙනස් නොවන ගුණය වන්නේ,

1) තාපීය ගුණය
2) රසායනික ගුණය
3) භෞතික ගුණය
4) ද්‍රවාංකය

20. යාන්ත්‍රික ගුණයක් සඳහන් පිළිතුර වන්නේ,

1) බර
2) ස්කන්ධය
3) දුස්ස්‍රාවීතාව
4) ආතතිය

21. ද්‍රව්‍යයක පවත්නා ඇදීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,

1) සුවිකාර්ය තාවයයි.
2) දැඩි බව
3) ආතති ශක්තිය
4) සම්පීඩන ශක්තිය

22. බුරුත කඳක අරටුවේ වර්ණය වන්නේ,

1) ලා දුඹුරු පාට වේ.
2) ලා කහ පාට වේ.
3) කළු පාට වේ.
4) ලා රතු පාට වේ

23. පරිමාණ කෝදුවකින් මනින ලද මිනුමක 1:1 ලෙස සටහන් කර තිබිණි. මෙහි 1:1 යන්නේ අදහස් කරන්නේ,

1) පූර්ණ පරිමාණ අගයකි.
2) කුඩා කරන ලද පරිමාණ අගයකි.
3) විශාල කරන ලද පරිමාණ අගයකි.
4) ඉහත කිසිවක් නොවේ.

24. බාහිරව පිහිටි එක් ලක්ෂයක සිට වෘත්තයකට ඇඳිය හැකි ස්පර්ශක ගණන,

1) 2කි.
2) 1කි.
3) 4කි.
4) 6කි.

25. කම්බි ඇණ තැබීමේදි මදක් ආනතියට තැබීමෙන් ඇතිවන වාසිදායකම තත්ත්වය වන්නේ,

1) ඇණ නැමීම වැලකීම.
2) ඇණ ආපසු ඇදී ඒම වැළකීම.
3) ඇණ හිස කැඩීයාම වැළකීම.
4) ඇණවල නම්‍යතා ගුණය රැක ගැනීම.

26. දැවයක එකවර රේඛා දෙකක් ඇඳ ගැනීමට භාවිතා කරන උපකරණය වන්නේ,

1) වරක්කලය
2) අදිනපිහිය
3) අඳින කටුව
4) කුඩුම්බි වරක්කලය

27. කියතක් මුවහත් තැබීමේදී තෙත්තියන් තැබීම යනුවෙන් හැඳින්වෙන්නේ,

1) දැනි සියල්ල එක මට්ටමකට ගා ගැනීම.
2) දැනි එකක් හැර එකක් පිරිගැම.
3) දැනිවල හැඩය සකස් කිරීම.
4) දැනි එකක් හැර එකක් දෙපසට නැමීම.

28. ද්‍රව්‍යයක පවත්නා විලයනීයතා ගුණය හඳුනාගැනීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,

1) ගණ ද්‍රව්‍යවල ගුණ වෙනස් කර ගැනීමට.
2) අච්චුවල වත්කර වාත්තු කර ගැනීමට.
3) කොටස් එකට තබා පැස්සුම් ක්‍රියාවලියට.
4) ඉහත සියල්ලටම.

29. ගඩොල් වල පවතින භෞතික ගුණාංගයක් නොවන්නේ,

1) හැඩය
2) හංගුරතාවය
3) වර්ණය
4) ප්‍රමාණය

30. දැව කඳක ඉරිමදය පිහිටා ඇත්තේ,

1) අරටුව මැදි කර ගෙනය.
2) එළයට පිට පැත්තෙනි.
3) අරටුවට පිට පැත්තෙනි.
4) පිට පොත්තට ඇතුලතිනි.

31. සකස් කරගන්නා කොන්ක්‍රීට් මිශ්‍රණයක් තැන්පත් කිරීමේදී එම කොන්ක්‍රීට් මිශ්‍රණයේ මධ්‍යම උෂ්ණත්වය විය යුත්තේ,

1) 30 C° නොවැඩි විය යුතුය
2) 70 C° නොවැඩි විය යුතුය
3) 30 C° වඩා වැඩි විය යුතුය
4) 70 C° වඩා වැඩි විය යුතුය

32. කොන්ක්‍රීට් වැර ගැන්වීම සඳහා භාවිතයට නොගන්නා ද්‍රව්‍ය ඇතුළත් පිළිතුරු වන්නේ,

1) දහර වානේ
2) නාරටි වානේ
3) මෘදු වානේ
4) කොටු දැල්

33. ඇස්බැස්ටෝස් නිපදවීමට යොදාගන්නා අමුද්‍රව්‍ය අතරින් ඇස්බැස්ටෝස් කෙඳි යොදා ගන්නා ප්‍රතිශතය වන්නේ,

1) 85%
2) 45%
3) 15%
4) 55%

34. ගැමි වහරේ කන මට්ටම යනුවෙන් හැඳින්වෙන උපකරණය වන්නේ,

1) ස්වාය මට්ටම් ලෑල්ල
2) මුළු මට්ටම
3) කුස්තානම
4) වරක්කලය

35. කේතුවක් එහි අක්ෂයට ආනතව කැපීමෙන් ලැබෙන වක්‍රය විය හැක්කේ,

1) වෘත්තයකි.
2) ඉලිප්සයකි.
3) පාරාවලියකි.
4) බහුවලියකි.

36. ඉදිකිරීම් ක්‍රියාවලීන් වලදී පෙවුම් කම්පක යොදාගනු ලබන්නේ,

1) ලීයක් යතු ගා ගැනීමට.
2) බිත්ති මුහුණතක් පිරිසිදු කර ගැනීමට.
3) කොන්ක්‍රීට් සුසංහසනය කිරීමට
4) දැව භාණ්ඩයක බොරදම් ගා ගැනීමට

37. දේශීය අත් ආවුද සහ උපකරණ අභිබවා බලවේග ආවුද සහ උපකරණ භාවිතයට කාර්මිකයන් නැඹුරු වීමට බලපා ඇති සාධක වන්නේ,

1) රළු ස්වභාවයක් ගැනීම සහ කාර්යක්ෂමතාව වැඩිවීමයි.
2) කාර්යක්ෂමතාව වැඩිවීම සහ කාර්යයෙහි නිවැරදි බවයි.
3) සම්මත මිමිවලට නොතිබීම සහ පහසුවෙන් මිලදී ගැනීමට හැකිවීමයි.
4) රළු ස්වභාවයක් ගැනීම සහ හොඳ නිමාවක් තිබීමයි.

38. දිය ගැසූ හුණු නිෂ්පාදනය කරනු ලබන්නේ

1) හුණු ගල් එළිමහනේ පුළුස්සා ගැනීමෙනි.
2) අළු හුණු වලට සිමෙන්ති කුඩු එක් කරගැනීමෙනි.
3) අළුහුණු වැලි ජලය සමග මිශ්‍ර කර ගැනීමෙනි.
4) අළු හුණු වලට ජලය එක් කර ගැනීමෙනි.

39. ලක්ෂයක් ගමන් කරනා පථය ලෙස හැඳින්වෙන්නේ,

1) සිරස් රේඛාවයි
2) තිරස් රේඛාවයි
3) රේඛාවයි
4) ආනත රේඛාවයි.

40. දැවයක පසාරු සිදුරක් විඳගැනීමට වඩාත් සුදුසුම නියන් වර්ගය වනුයේ,

1) පට්ටම් නියන.
2) බොකු නියන
3) පැතලි නියන
4) රේගල් නියන

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 ට පිළිතුරු ලියන්න.**
- **මෙම පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 60 කි.**

01. i. එකිනෙක කේන්ද්‍රයන් අතර දුර 90mm වනසේ පිහිටා ඇති අරයන් 40mm සහ 25mm වන අසමාන වෘත්ත දේකට පොදු බාහිර ස්පර්ශකයක් නිර්මාණය කරන්න. (ලකුණු 12)

ii. පරිමිතිය 100mm වන සමපාද ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

02. අපට ප්‍රයෝජන රාශියක් ලබාදෙන ඉදිකිරීම් අමුද්‍රව්‍යක් ලෙස දැව හැඳින්විය හැක.

i. දැවවල පවතින ස්වභාවික ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

ii. කෘතීම දැව යනු කුමක්දැයි හඳුන්වා ඊට උදාහරණ 02 ක් නම් කරන්න. (ලකුණු 03)

iii. ස්වභාවික දැව පදම් කිරීම සිදුකරන ආකාරය කෙටියෙන් හඳුන්වා දව පදම් කිරීමෙන් ලැබෙන වාසි 02 ක් ලියන්න. (ලකුණු 05)

03. විවිධ කාර්යයන් සිදුකිරීමේදී විවිධ කොටස් එකලස් කිරීම් සඳහා විවිධ සවිකුරු භාවිතයට ගනී.

i. සවිකුරු වර්ග 03 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. දොර ජනෙල් සවි කිරීම සඳහා බහුලව භාවිතයට ගන්නා සරඹේරු වර්ග තුනක් රූප සටහන් ඇඳ නම් කරන්න. (ලකුණු 06)

iii. ඉස්කුරුප්පු ඇණ මගින් දැව කොටස් දෙකක් එකට සම්බන්ධ කරන ආකාරයේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

04. විවිධ අමුද්‍රව්‍යයන් කොටස් කර ගැනීම සඳහා විවිධ ආවුද හා උපකරණ භාවිතා කරයි.

i. අත් ආවුද හා බලවේග ආවුද සඳහා උදාහරණ 02ක බැගින් වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

ii. කැපීමේ හා සෑහීමේ ආවුද උපකරණ 02ක් නම් කොට රූප සටහන් අඳින්න. (ලකුණු 04)

iii. අත්තිවාරම් බැම්මක තිරස් මට්ටම සකසා ගැනීම සඳහා ලෙවල් බටයක් ආධාරයෙන් ලෙවල් කිරීම සිදුකරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

PAST PAPERS WIKI

Past Papers Wiki

05. කොන්ක්‍රීට් යනු ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බහුලව භාවිතා කරනු ලබන ද්‍රව්‍ය කිහිපයක මිශ්‍රණයකි.

i. තනි කොන්ක්‍රීට් මිශ්‍රණ අනුපාතයක් නම් කොට යොදා ගන්නා අවස්ථාවක් ලියන්න. (ලකුණු 02)

ii. ගුණාත්මක කොන්ක්‍රීට් මිශ්‍රණයක් සකස් කිරීම සඳහා භාවිතා කරන රළු සමාහාරවල තිබිය යුතු ගුණාංග තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. සකස් කරන ලද කොන්ක්‍රීට් ව්‍යුහයක් තුළ දැකිය හැකි දෝෂයන් හතරක් නම් කොට ඉන් තුනක් එම දෝෂය ඇතිවීමට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනීමේදී එම ද්‍රව්‍ය දෝෂ වලින් තොර ඒවාද යන්න පරීක්ෂා කර භාවිතයට ගත යුතුය.

i. දැව දෝෂ දෙකක් රූප සටහන් ඇඳ නම් කරන්න. (ලකුණු 03)

ii. ගඩොල් වල දෝෂ හතරක් නම් කරන්න. (ලකුණු 02)

iii. දැව සංරක්ෂණය කිරීම යනු කුමක්දැයි හඳුන්වා දැව සංරක්ෂණය කරන සාම්ප්‍රදායික ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 03)

iv. කොන්ක්‍රීට් පදම් කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම තුනක් නම් කරන්න. (ලකුණු 02)

07. ආවුද වලින් දීර්ඝ කාලීනව වැඩ කිරීමේදී එම ආවුද වල කැපීම අඩුවන විට ඒවා මුවහත් කිරීමට සිදුවේ.

i. ආවුද මුවහත් කිරීම සඳහා භාවිතා කරන උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

ii. අනතුරු ඇතිවීමට බලපාන සාධක හතරක් ලියන්න. (ලකුණු 02)

iii. කාර්යයක් කිරීමේදී ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න. (ලකුණු 02)

iv. ඉහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

උපකරණය	මුවහත් තැබීමේ කෝණය
යතු තලය	.....
.....	118^0
.....	60 ($45^0 - 15^0$)
පැතලි කපන කටුව	.....

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I, II	පිළිතුරු පත්‍රය
10		

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I පත්‍රය

(1). 2	(11). 2	(21). 3	(31). 2
(2). 1	(12). 4	(22). 2	(32). 3
(3). 3	(13). 2	(23). 1	(33). 3
(4). 1	(14). 1	(24). 1	(34). 1
(5). 2	(15). 3	(25). 2	(35). 2
(6). 3	(16). 4	(26). 4	(36). 3
(7). 4	(17). 1	(27). 4	(37). 2
(8). 3	(18). 2	(28). 4	(38). 4
(9). 1	(19). 3	(29). 2	(39). 3
(10). 3	(20). 4	(30). 1	(40). 4

II කොටස

(02) (i)
- වෘත්ත දෙක ඇඳීම
- නියමිත දිගින් යුතුව කේන්ද්‍රයන් යා කිරීම (ලකුණු 02)
- අරයන් දෙකී වෙනස ගෙන ලොකු වෘත්තයේ කේන්ද්‍රයේ තවත් වෘත්තයක් ඇඳීම. (ලකුණු 01)
- කේන්ද්‍රයන් අතර දුර සමච්ඡේද කිරීම (ලකුණු 02)
- අර්ධ වෘත්තයක් ඇඳීම (ලකුණු 02)
- කුඩා වෘතයේ කැපෙන රේඛාව දික් කිරීම (ලකුණු 02)
- ලොකු වෘත්තය කැපෙන ස්ථානය සොයා ගැනීම. (ලකුණු 01)
- ස්පර්ශකය ඇඳිය යුතු ස්ථාන ලකුණු කිරීම. (ලකුණු 01)
- බාහිර ස්පර්ශකයක් ඇඳීම (ලකුණු 01)

ii. නියමිත දිගට සරල රේඛාව ඇඳීම (ලකුණු 01)
ආනත රේඛාව ඇඳ සරල රේඛාව සමාන කොටස් තුනට බෙදීම. (ලකුණු 04)
නිවැරදිව සමපාද ත්‍රිකෝණය ඇඳීම (ලකුණු 03)

Past Papers Wiki

(02) (i)
- ශක්තිය
- අලංකාරය
- කල්පැවැත්ම
- නැමෙන සුළු බව
- සුවඳ
- වර්ණය
- දැඩිබව

(නිවැරදි පිළිතුරු 4 ක් සඳහා ලකුණු 02)

(ii) ස්වාභාවික දැවවල කොටස් සහ කෘතිම මැලියම් යොදා ගනිමින් යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරන දැව තුනීලැලි, චිප් බෝර්ඩ්, හාර්ඩ් බෝර්ඩ්, ආකෘත ලැලි, බ්ලොග් බෙස් යන ආදිය අදහසට ගැලපෙන අදහසක් ලියා ඇත්නම් ලකුණු 02 ක්ද, උදාහරණ 02 ක් සඳහා ලකුණු 01 ක්ද ලෙස මුළු ලකුණු 03කි.)

(iii)
- දැවවල අනවශ්‍ය බර ඉවත් වීම
- ප්‍රමාණවත් ලෙස ශක්තිය වර්ධනය වීම
- වැඩ කිරීමේ හැකියාව වැඩිවීම
- පලුදු හා පුපුරා යාම අවම වීම
- පවත්නා ආයු කාලය ඉහළ යෑම

(නිවැරදි හැඳින්වීමකට ලකුණු 03ක්ද උදාහරණ 04 ක් සඳහා ලකුණු 02 ක් ලෙස මුළු ලකුණු 05කි.)

(03) (i) ඇණ , කොන්ඩි පට්ටම් ,ජනේල් කොකු
සරනේරුව , යතුරු තහඩු, සොයිබ,
(නිවැරදි පිළිතුරු 02 ක් සඳහා ලකුණක්ද , පිළිතුරු 03 ක් සඳහා ලකුණු 02 කි)

(ii) (රූප සටහන් 03 සඳහා ලකුණු 03ක්ද නිවැරදි නම් කිරීම් සඳහා ලකුණු 03 ලෙස මුළු ලකුණු 06කි.)

(iii) (නිවැරදිව පැහැදිලි කර ඇත්නම් ලකුණු 02 කි)

(04) (i)

<u>අත් ආවුද</u>	බලවේග ආවුද
අත්කියත	බහු කාර්ය ලී වැඩ යන්ත්‍රය
අත්විදුම් යන්ත්‍රය	විදුලි විදුම් යන්ත්‍රය
මට්ටම් යත්ත	ඇන්ගල් ග්‍රයින්ඩරය
සවල	ද්‍රාව ජැක්කුව

(නිවැරදි නම් කිරීම් 04 ට ලකුණු 02යි)

(ii) (නිවැරදි රූප සටහන් දෙකකට ලකුණු 02 යි. නිවැරදි නම් කිරීම් 02 කට ලකුණු 02 ක් ලෙස මුළු ලකුණු 04 යි)

(iii) (නිවැරදිව පැහැදිලි කර ඇත්නම් ලකුණු 04යි)

(05) (i) 1:3:6 අත්තිවාරම් , පතුල්
ඇතුරුම් පුවරු
යන්ත්‍ර සූත්‍ර සවිකරණ ස්ථාන
ගෙබිම සඳහා
(නිවැරදි මිශ්‍රණ අනුපාතයට ලකුණු 01 ක්ද උදාහරණයට ලකුණු 01 ලෙස මුළු ලකුණු 02 යි)

(ii) උසස් ශක්තිය, කල් පැවැත්ම, අප ද්‍රව්‍ය වලින් තොරවීම, ප්‍රමාණය අනුව වර්ග වී තිබීම
(ආදී නිවැරදි පිළිතුරු 03 ක් සඳහා ලකුණු 03යි)

(iii) වර්ණ වෙනස් වීම, දූවිලි මතුවීම, පතුරු ගැලවීම, බුබුළු මතුවීම, මී වදවනය කුහර ඇතිවීම
(නිවැරදි දෝෂ හතර සඳහා ලකුණු 02ක්ද දෝෂ 03 ක් හෝ 02 ක් සඳහා ලකුණු 01 ද , හැඳින්වීම් 03 ක් සඳහා ලකුණු 03 ලෙස මුළු ලකුණු 05කි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(06) (i) (නම් කිරීම් දෙක සඳහා ලකුණු 01 ක්ද , රූප සටහන් 02 ට ලකුණු 02 වශයෙන් ලකුණු 03කි)

(ii) නිවැරදි දෝෂ 4ක් සඳහා ලකුණු 02යි.

(iii) (නිවැරදි හැඳින්වීමට ලකුණු 02 ක්ද යොදාගන්නා ක්‍රම 02 ක් සඳහා ලකුණු 01 ලෙස මුළු ලකුණු 03 කි.)

(iv) තෙත ගෝනි යෙදීම
කොහොබත් යෙදීම
තට්ටු සඳහා වතුර පුරවා තැබීම
(නිවැරදි පිළිතුරු 3ක් සඳහා ලකුණු 2ක්ද පිළිතුරු දෙකක් හෝ 1 සඳහා ලකුණු 01කි)

07. (i) පිරි වර්ග
වැලි ගල
තෙල් ගල
නිමදුම් යන්ත්‍රය
තෙත් තියන් අඬුව
(නිවැරදි පිළිතුරු හතරක් සඳහා ලකුණු 02ක් ද පිළිතුරු තුනක් හෝ දෙකක් සඳහා ලකුණු 01 කි.)

ii. (නිවැරදි පිළිතුරු හතරක් සඳහා ලකුණු 02ක් ද පිළිතුරු තුනක් හෝ දෙකක් සඳහා ලකුණු 01 කි.)

iii. (නිවැරදි පිළිතුරු හතරක් සඳහා ලකුණු 02ක් ද පිළිතුරු තුනක් හෝ දෙකක් සඳහා ලකුණු 01 කි.)

iv. $20^0 – 25^0 – 30^0$-35^0
ඇඹරුම් විදුම් කටු
අත් කියත
60^0
නිවැරදි පිළිතුරු හතරට ලකුණු 04 කි.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library